**මහර ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

මහර ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
**මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| යොමු අංකය | නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.2(ඉ ) | ආයුර්වේද තොග ගිණුම සකස්කිරීමේදී ප්‍රවර්තන වර්ෂයේ පාරිභෝජනය කළ තොග වටිනාකම රු.1,108,230 ක් ලෙස සටහන්කර තිබුණද සත්‍ය පාරිභෝජන තොගය රු.1,033,609 ක් වූයෙන් වෙනස රු.74,621 ක් විය. | නිවැරදි තොග වාර්තා පවත්වා ගතයුතු වේ. |
| 1.6.2(ඊ) | ජර්නල් සටහන් 1 මගින් ආරම්භක ශේෂ ගිණුම්ගතකර තිබුණද පෙර නොපැවති සංචිත හා වෙන් කිරීමේ ගිණුමේ රු.26,364,842 ක ආරම්භක ශේෂයක් සටහන්කර තිබුණි. මේ තුල ලැබියයුතු රු.69,203,620 ක් හා ගෙවියයුතු රු.42,388,781 ක ශේෂයක් තිබූ අතර පළාත් පාලන ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති අංක 15.13 ට හා 15.1 නියමයන්ට පටහැනිව ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයට ගලපා තිබුණි. | නව ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ රීති පිළිබඳ පැවැත්වූ පුහුණු වැඩසටහන් වල හා රැස්වීම් වලට අනුකූලව ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය සකසන ලදී. |

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| **ගිණුම් කරණ ප්‍රමිතය** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 6.20 | සමාලෝචිත වර්ෂයේ වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිශතය හෙළිදරව් කර නොතිබුණි. | | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතුය. |
| 9.3 සහ 9.4 | කසළ බදු ලේඛනය අනුව, ආයතන 105 කින්, 2021 වර්ෂයට අදාළ නමුත්, අයකර නොතිබුණ කසළ බදු වටිනාකම රු.559,950 ක්, පනවන කාල පරිච්ඡේදයෙහි අයභාරය ලෙස හඳුනාගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ සිට නිවැරදි කරමි. | වර්ෂයට අදාල අයභාරය සහ වාර්තා කරන දිනට අවසානයේ ශේෂව ඇති ලැබියයුතු දැ වත්කම් හඳුනා ගෙන නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| 3.6 | ප්‍රවර්තන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලට අදාල කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති සියළුම වටිනාකම් සඳහා පෙර වූ සමාන කළහැකි කාලපරිච්ඡේදය සම්බන්ධව සැසඳිය හැකි තොරතුරු තුලනාත්මකව විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | | |

## 1.6.2. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් වටිනාකම රු.18,283,287 ක් විය යුතු වුවත්, එය රු.18,370,206 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.86,919 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් කාල පරිච්ඡේදයට අදාල අයභාරය නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ආ ) | සමාලෝචිත වර්ෂයේ ආයුර්වේද තොග හානි වටිනාකම රු.55,970 ක්, වත්කම් වගකීම් ප්‍රකාශයෙහි සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි තොග හානි ලෙස වර්ගීකරණය කර ගිණුම්ගත කිරීම වෙනුවට, පරිභෝජනය කරන ලද ආයුර්වේද තොග ලෙස ගිණුම්ගත කර තිබුණි. | | තොග ගනුදෙනු නිවැරදි වර්ගීකරණය යටතේ ගිණුම්ගත කල යුතුය. |
| (ඇ ) | 2020 දෙසැම්බර් 31 දිනට ණය හිමියන් යටතේ, වෙන්කර තිබුණ ගොඩනැගිලි රු.8,400,000 ක්ද, යන්ත්‍ර සඳහා රු.10,300,000 ක් ද වී තිබුණි. ණය හිමි වටිනාකම රු.1,161,777 ක්, ගොඩනැගිලි වටිනාකම රු.1,079,600 ක් සහ යන්ත්‍ර වටිනාකම රු.82,177 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | | නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (ඈ) | පුස්තකාල පොත් ක්ෂය රු.1,359,070 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | |

## 1.6.3. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත් කරන ලද ලේඛන අනුව, ණය ගැති ශේෂය රු.18,399,337ක් තුල වසර 1 ත් 3 ත් අතර ශේෂය රු.13,396,032 ක් විය. මෙම හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | ණයගැති ශේෂ ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ණය ගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ ) | 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු හා එකතු කළ අගය මත බදු වටිනාකම රු.2,061,792 ක් තුල වසරකට වැඩි වටිනාකම රු.1,827,851 ක්ව තිබූ අතර ගෙවීමට කටයුතුකර නොතිබුණි. | ඉදිරියේදී ගෙවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | එකතුකල බදු මුදල් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත් කරන ලද ලේඛන අනුව විවිධ ණයහිමි ශේෂය රු.116,100,458 ක් තුල වර්ෂයකට අඩු රු.59,016,015 ක්, වසර 1 ත් 3 ත් අතර රු.57,084,443 පැවති බව නිරීක්ෂණය වූ අතර ගෙවීමට කටයුතුකර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති ණයහිමි ශේෂයන් කපා හැරීමට කටයුතු කරමි. | ණය හිමි ශේෂයන් පිළිබදව පරීක්ෂා කර ගෙවිය යුතු ශේෂ ගෙවීමටත්, සාවද්‍ය ලෙස ගිණුම්ගත වූයේ යැයි නිශ්චිතව හඳුනා ගන්නා ලද ශේෂ ගිණුම්වලින් ඉවත් කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 1.6.4. නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 04 ක ශේෂ එකතුව රු.109,362,584 ක් වුවද, උපලේඛනය අනුව ශේෂයන්ගේ එකතු වටිනාකම රු.77,476,218 ක් වූයෙන් රු.31,886,366 ක වෙනසක් පැවතුණි. | ගිණුම් විෂයන් 2 ක් පෙර වර්ෂ වල සිට පැවතගෙන එන වෙනසක් බැවින්ද, ගිණුම් විෂයන් 2 ක ලදුපත් නිකුත් කිරීමේදී ආදායම් ශීර්ෂ වෙනස්වී ඇති බැවින්ද, ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් වාර්තා ඊට අදාල ලේඛන හා උප ලේඛන සමග සසදා නිවැරදි ශේෂ පවත්වා ගත යුතුය. |

### 1.7. අනුකූල නොවීම්

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24(1) ආ වගන්තිය | සභා බල ප්‍රදේශයට අයත් නව මංමාවත් සම්බන්ධ සමීක්ෂණයක් සිදුකර, නාම ලේඛනයක් ගැසට්පත්‍රයක් මගින් පලකර, සියළු මාර්ග සභා අයිතියට පවරා ගතයුතු වුවද එසේ කර නොතිබුණි. | මාර්ග මැනීමට විශාල මුදලක් වැය වන බැවින් වසරකට ගැසට් කිරීමට හැකි වන්නේ මාර්ග 10 ක් පමණි. 2022 වර්ෂය සඳහා මාර්ග 10 ක් මැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 73 | මූල්‍ය රීතීන් අනුව සහතිකයක් මගින් තහවුරු කරගැනීමකින් තොරව සැපයුම්කරුවන් 12 දෙනෙකුට අදාළව රු.433,986 ක භාණ්ඩ හා සේවා ගබඩාවට ලබා ගැනීමට පෙර ගෙවීම් කර තිබුණ බව නිරීක්ෂණය වූ | තොරතුරු සොයා නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | මූල්‍ය පාලනයට අදාල රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | අතර, එයින් රු.385,466 ක් 2020 දෙසැම්බර් 31 දින සිට පැවත එන ශේෂයක් වී තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 02 ක ට වැඩි කාලයක් කල් ඉකුත්ව තිබූ රු.2,984,734 ක වටිනාකමින් යුතු සියයට 10 ක අත රැඳවුම් තැන්පතු ශේෂ 8 ක් සහ ටෙන්ඩර් තැන්පත් ශේෂ 75 ක් ලෙස ශේෂ තැන්පතු 113 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2017, 2018 වර්ෂවල තැන්පත් ශේෂ වලට අදාල තැන්පත්කරුවන් දැනුවත් කර මෙම දිනවල එම රැඳවුම් මුදල් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. ඉතිරි මුදල් සහා අනුමැතිය යටතේ ආදායමට ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

2.1. **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.85,829,929 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,463,249 ක් විය.

2.2. **ආදායම් පරිපාලනය**

--------------------

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් කාල විශ්ලේෂණය අනුව, වසරකට වැඩි හිඟ වරිපනම් වටිනාකම රු.28,838,295 ක්ව තිබුණු අතර එයින් වසර 1 ත් 3 ත් අතර, වසර 3 ත් 5 ත් අතර, වසර 5 ත් 10 ත් අතර හා වසර 10 ට වැඩි වරිපනම් වටිනාකම පිළිවෙලින් රු.25,136,980 ක්, රු.763,279 ක්, රු.624,337 ක් හා රු.2,313,700 ක් වූ අතර, එම වටිනාකම් අයකරගැනීම සඳහා, වරෙන්තු නිකුත් කිරීම ඇතුළුව ගතයුතු කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවිය. | නව දත්ත ඇතුලත් කිරීමේදී සිදුව ඇති අත්වැරදීම් හා තක්සේරු ලේඛන වල අඩු පාඩු මත (දේපල මඟහැරීම,අභාවිත අංක බිල් වීම, එකම දේපළ දෙවරක් බිල් වීම, එකම දේපළ මාර්ග දේකකට තක්සේරු කර තිබීම)නිවැරදි කිරීම තව දුරටත් සිදු කරමින් පවතී. මේ වන විට ඉතිරි හිඟ මුදල් අය කර ගැනීමට ක්ෂේත්‍රයේ නිළධාරීන් යොදවා ඇත. | හිඟ වරිපනම් හා බදු ආදායම අයකර ගැනීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණුවලට සවිකරන ලද තරංග හුවමාරු අයත් ආයතනවලින් ව්‍යාපාර බදු අයකරගැනීමට කටයුතුකර නොතිබුණ අතර, සභා බල ප්‍රදේශයේ සම්ප්‍රේෂණ කුළුණු 12 ක රු.36,000 ක හිඟ ආදායමක් 2022 මැයි 19 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්වය නිසා භාරතී එයාටෙල් සමාගමෙන් රු.15,000 ක්ද, ලංකා බෙල් සමාගමෙන් රු.3,000 ක්ද, ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනයෙන් රු. 18,000 ක්ද, වූ බදු මුදල් අයකර ගැනීමට නොහැකි විය. එම මුදල් ගෙවන ලෙස ලිපි මඟින් දැනුවත් කර, දුරකථනයෙන් විමසීමේදී චෙක්පත් තැපැල් කර ඇති බව දැන්වීය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මාර්ග ලේඛනය අනුව බල ප්‍රදේශයේ මාර්ග සංඛ්‍යාව 7,943 ක් වුවද, එහි පුද්ගලික මාර්ගද පවතින බවත්, ඒවා වෙන්කර හඳුනාගෙන නොතිබූ බවත්, නිරීක්ෂණය විය. 2021 දෙසැම්බර් 31 දින වන විට ඉන් ගැසට් කර තිබුණේ මාර්ග 24 ක් පමණක් වූ බවත්, 2022 මැයි 31 දින වනවිට එයින් මාර්ග 10 ක පමණක් පිඹුරුපත් සකස්කර ඇති බවත්, මාර්ග 10 ක පිඹුරුපත් සකස් කරමින් පවතින බවත් නිරීක්ෂණය විය. | මේ දිනවල සභා මාර්ග හඳුනාගනිමින් සිටී. මේ වන විට මාර්ග 24 ක් ගැසට් කර ඇත. 2022 වර්ෂය සඳහා මාර්ග 10 ක පිඹුරුපත් සකස් කරමින් පවතී. | පුද්ගලික සහ සභා මාර්ග වෙන්කර හඳුනාගෙන, පිඹුරුපත් සකස්කර, ගැසට් කිරීමට පියවර ගත යුතුය |

3.2. **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සේවක පුරප්පාඩු | | |
| 2021 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්ය මණ්ඩලය අනුමත සංඛ්‍යාව 154 ක්ද සත්‍ය සංඛ්‍යාව 131 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 23 ක් පැවතුණි. | ආයුර්වේද වෛද්‍ය නිලධාරී, පුස්තකාලයාධිපති, ආදාහනාගාර ක්‍රියාකරු පුරප්පාඩු පිළිබඳව කාර්තු වාර්තා මගින් අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත.<br>පෙර පාසල් ගුරු පුරප්පාඩුව පිරවීමට 2021 අප්‍රියෙල් 22 දින පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලැබී ඇතත් බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් බඳවා ගැනීම් කළ නොහැකි වී ඇත.<br><br>පෙර පාසල් සහායක තනතුරු 2012 පෙබරවාරි 28 සිට පුරප්පාඩු වී ඇත. අනුමත කාර්ය මණ්ඩලය තුල තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත වී ඇති බැවින් නැවත බඳවා ගැනීමක් සිදු කළ නොහැක. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතුය. |
| (ආ) සේවක ණය | | |
| 2017 ජූනි සිට 2021 දෙසැම්බර් දක්වා කාලය තුළ විශ්‍රාම ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු.799,729 ක්ද, 2021 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ මිය ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් රු.633,635 ක් ද ණය හා අත්තිකාරම් ශේෂයන් අයවීම හිඟ හිටව පැවතුණි. | නිලධාරින් 6 දෙනෙකුගේ ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන්, අයකර ගැනිමට කටයුතු කරමින් පවතී. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |